# නාට්‍ය පෙළ රංගයක් බවට පත් කිරීම

නාට්‍ය පිටපතක් රංගයක් බවට පත් කිරීමට පෙර ඔබ විසින් ලියන ලද හෝ වෙනත් අයෙකු විසින් ලියන ලද සුදුසු නාට්‍ය පිටපතක් තෝරා ගත යුතුය.ඉන් පසු එම නාට්‍ය පිටපත හොඳින් අධ්‍යනය කළයුතුය. ඉන් පසු ඒ සඳහා සුදුසු නළු නිළියන් තෝරා ගත යුතුය. (නළුවරණය ලෙසද මෙය හඳුන්වයි.) ඉන් පසු සුදුසු පරිදි අනුෂාංගික අංග නිර්මාණය කළ යුතුය.

- රංග වස්ත්‍ර
- රංග භාණ්ඩ
- පසුතල නිර්මාණ
- අංග රචනය හෙවත් වේෂ නිරූපණය
- ආලෝකකරණය

මෙහි අනුෂාංග නිර්මාණය සඳහා ශිල්පයේ දක්ෂතා ඇති පිරිස තෝරා ගතහැකිය. මෙලෙස සියලු ශිල්පීන් තෝරාගත් පසු පුහුණුවීම් ආරම්භ කළ යුතුය. හොඳින් පුහුණුවීම් සිදුකිරීමෙන් අනතුරුව අනුෂාංග ශිල්පීන් සමග පුහුණුවීම් වාර කිහිපයක් පැවැත්විය යුතුය. අවසානයේ විෂය ප්‍රවීණයෙකුට නාට්‍ය පෙන්වා ඔවුන් ගේ උපදෙස් පරිදි ඔබට අඩුපාඩු සකසා ගත හැකිය. පුහුණුවීමේ සිට වේදිකාගත කරන මොහොත දක්වා නාට්‍ය පෙළ මතක් කරන්නෙක් යොදා ගත හැක. අවසානයේ නිර්මාණය කරගත් නාට්‍ය පාසල් වේදිකාව ප්‍රයෝජනයට ගෙන රගදැක්විය හැක. නාට්‍ය අවසානයේ නැරඹූ පිරිසගෙන් නාට්‍ය පිළිබඳ ගුණදොස් විමසිය හැක.

සාර්ථක නාට්‍ය පෙළක් සඳහා පිටපත හොඳින් අධ්‍යනය කළ යුතුය. අවබෝධ කරගත යුතුය.නාට්‍යයේ එන චරිත වල ස්වාභාවයන් මනාව තේරුම්ගත යුතුය. එහි ශිලපීන්ට චරිතය පිළිබඳ වටහා දිය යුතුය. සියලුම ශිල්පීන් සමග සුහදව කටයුතු කළ යුතුය.

අවසානයේ අපූර්ව වූත්, නිර්මාණාත්මක වූත් නාට්‍යක් බිහිකළ යුතුය.

**පැවරුම : පෙර පාඩමේ දී රචනා කරන ලද පිටපත රංගයක් බවට පත් කරන්න.**